සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

තෙවන වාර පරීක්ෂණය - 2024
மூன்றாம் தவணை பரீட்சை- 2024
Third term test – 2024

ශ්‍රේණිය- 13
தரம்- 13
Grade - 13

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය,
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை,
General Certificate of Education (Adv. Level) Examination.

චිත්‍ර කලාව I
சித்திரக்கலை I
Art I

51 S I

❋ මෙම කොටස අනු කොටස් **තුනකින්** සමන්විත ය.

❋ **'අ'** කොටසින් ප්‍රශ්න දෙකක් හා **'ආ'** සහ **'ඉ'** කොටස් දෙකෙන් එක් ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.
(අවශ්‍ය තැන්හි පිළිතුරු සචිත්‍ර කිරීම ඔබට වාසිදායක වේ.)

**'අ' කොටස**

**(චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ශ්‍රී ලංකාව)**

1. හෙළ කලාකරුවාගේ නිර්මාණ කෞශල්‍යයේ විශිෂ්ටත්වය මූර්ති කැටයම ශෘහනිර්මාණ තුළින් මනාව පැහැදිළි වේ.
   (i) ලංකාවේ බුදු පිළිම අතර ආබද්ධ හා ආබද්ධ නොවන පිළිම **දෙකක්** නම් කරන්න (ලකුණු 02 යි.)
   (ii) පොළොන්නරු තිවංක පිළිමගෙයි ශෘහ නිර්මාණ ආකෘතිය තුළින් පෙන්නුම් කරන හින්දු වාස්තුවිද්‍යා ලක්ෂණ පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 05 යි.)
   (iii) අනුරාධපුර යුගයේ සහ පොළොන්නරු යුගයේ බුදු පිළිම වල දැකගත හැකි සුවිශේෂී ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 08 යි.)

2. ශ්‍රී ලංකාවේ ලෝකඩ කලා නිර්මාණ පිළිබඳ සඳහන් කිරීමේ දී ලාංකේය කලාකරුවා ලෝහ වාත්තු කිරීමේ ක්‍රම ශිල්ප පිළිබඳ තිබූ දක්ෂතාවය මනාව පැහැදිළි වේ.
   (i) ශ්‍රී ලංකාවේ දැනට හමුවී ඇති ලෝකඩ කලා නිර්මාණ අතරින් කාන්තා සහ පුරුෂ ලෝකඩ ප්‍රතිමා **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි.)
   (ii) දැදිගම කොටවෙහෙර සුතිඝර විහාරයේ තිබී හමු වූ ඇත් පහණේ කලාත්මක ලක්ෂණ හා තාක්ෂණය පිළිබඳ කෙටි ඇගයීමක් කරන්න. (ලකුණු 05 යි.)
   (iii) නිර්මාණාත්මක ආකෘතිය, සංකල්පීය ලක්ෂණ හා තාක්ෂණය අළලා නටරාජා ප්‍රතිමාවේ නිමාව පිළිබඳ විග්‍රහ කරන්න . (ලකුණු 08 යි.)

3. ලාංකේය සිතුවම් කලා ඉතිහාසය පිළිබඳව විමසීමේ දී 20 වන සියවසේ බිහි වූ චිත්‍ර ශිල්පීන් චිත්‍ර කලාවේ උන්නතියට මහත් මෙහෙවරක් කළ අය වූහ.
   (i) ලංකා කලා සංගමය පිහිටුවීමෙහිලා මූලිකත්වය ගත් ශිල්පීන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02 යි.)
   (ii) "බෙල්ලන්විල විහාරයේ ඇඳ ඇති මාර පරාජය චිත්‍රය තුළින් ශිල්පියා බුද්ධිමය විග්‍රහයක යෙදීමට උත්සාහ ගෙන ඇත" විමසන්න (ලකුණු 05 යි.)
   (iii) විසිවන සියවසේ ශ්‍රී ලාංකේය විහාර සිත්තරුන් පෙරදිග හා අපරදිග කලාමූල බෞද්ධ චිත්‍ර කලාවේ දී භාවිතයට ගෙන ඇති ආකාරය සංසන්දනාත්මකව විමසන්න. (ලකුණු 08 යි.)

[දෙවන පිටුව බලන්න

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

## 'ආ' කොටස
## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ඉන්දියාව)

4. ලෝකයේ බිහිවූ විවිධ ශිෂ්ටාචාර අතුරින් ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට හිමිවන්නේ විශේෂ ස්ථානයකි.
   (i) ඉන්දුනිම්න ශිෂ්ටාචාරයේ හමුවූ ටෙරාකොටා නිර්මාණයක් හා ලෝකඩ නිර්මාණයක් නම් කරන්න. (ලකුණු 02 යි.)
   (ii) ඉන්දුනිම්න ශිෂ්ටාචාරය පුරා මාතෘ මූලික සමජයක් පැවති බවට සාධක පෙන්වා දෙන්න. (ලකුණු 05 යි.)
   (iii) ඉන්දුනිම්න වැසියන් ආරක්ෂාව හා සෞඛ්‍ය පිළිබඳ සැලකිලිමත් වී ඇති ආකාරය එම ශිෂ්ටාචාරයේ වාස්තු විද්‍යා සාධක ඇසුරින් කෙටියෙන් විමසන්න. (ලකුණු 08 යි.)

5. භාරතීය චිත්‍ර කලාවේ විශිෂ්ටත්වය පෙන්වන චිත්‍ර කලා ආරවල් ලෙස මෝගල් හා රාජ්පුට් චිත්‍ර පෙන්වාදිය හැකිය.
   (i) ප්‍රසිද්ධ රාජ්පුට් චිත්‍රයක් හා මෝගල් චිත්‍රයක් පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 02 යි.)
   (ii) මෝගල් වාස්තුවිද්‍යා නිර්මාණයක් වන ටජ්මහල් මන්දිරය පිළිබඳ කලා ඇගයීමක් කරන්න (ලකුණු 05 යි.)
   (iii) මෝගල් හා රාජ්පුට් චිත්‍ර අතර දැකගතහැකි සමාන අසමානතා උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 08 යි.)

## 'ඉ' කොටස
## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - යුරෝපය)

6. ලෝක කලා ශිෂ්ටාචාර අතර ඊජිප්තු ශිෂ්ටාචාරයට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි
   (i) ඊජිප්තු නිර්මාණ අතර පැරණි රාජධානි සමයට හා නව රාජධානි සමයට අයත් කලා නිර්මාණ **එක** බැගින් ලියන්න. (ලකුණු 02 යි.)
   (ii) ඔබ කැමති මිසර දේවස්ථානයක් තෝරා ඒ පිළිබඳ කලා ඇගයීමක් කරන්න. (ලකුණු 05 යි.)
   (iii) මිසර සිතුවම් කලාවේ සුවිශේෂිතා උදාහරණ සහිතව පැහැදිලි කරන්න (ලකුණු 08 යි.)

7. ලෝක කලා ඉතිහාසයේ නිර්මාණ අතර රෝමානු කලාවට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි.
   (i) ප්‍රසිද්ධ රෝම කුලුණක් හා ආරුක්කුවක් නම් කරන්න (ලකුණු 02 යි.)
   (ii) රෝම වාස්තුවිද්‍යා නිර්මාණයක් වන කොලෝසියම පිළිබඳ කලා ඇගයීමක් කරන්න. (ලකුණු 05 යි.)
   (iii) 'පුද්ගල අනන්‍යතාව තත්වාකාරයෙන් නිරූපණය කිරීමේ දී ග්‍රීක කලාකරුවාට වඩා රෝම කලාකරුවා ඉදිරියෙන් සිටී'. උදාහරණ සහිතව පෙන්වා දෙන්න (ලකුණු 08 යි.)

* * *

PAST PAPERS WIKI

(2) WWW.PastPapers.WiKi (2)

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

PARCEL NO

LOL.lk
BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න





කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION | pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

**සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට**

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න